258

# සිංහල සංස්කෘතියෙහි සමාජ සම්මත ආචාර ධර්ම සමාජීය පැවැත්ම උදෙසා බලපාන ආකාරය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

කේ. එන්. දයාරත්න

SOCI / M / ISR / 97

කැලණිය විශ්ව විද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ
සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා
ඉදිරිපත් කරන ලදී.

ප්‍රවිෂ්ට අංකය 258
වර්ග අංකය

1999 - ඔක්තෝම්බර්

# හැඳින්වීම

සමාජයක් යනු මිනිසුන් රාශියක් එක්ව ජීවත් වෙමින් නොයෙකුත් සමාජීය ක්‍රියා පදනම් කොට ගත් ආයතනයකි. මෙවැනි සමාජයක් නිරන්තරයෙන් වෙනස් වන්නේය. එම නිසා එම වෙනස් වීම් පිළිබඳ අවබෝධයකුත්, එම වෙනස තුළ ඔවුන්ගේ හැසිරීම් ක්‍රියා පාලනය වන්නේ කෙසේ ද ඒ සඳහා බලපාන ධර්මතා මොනවාද? යන්න පිළිබඳ අවබෝධයකුත් එම සමාජයේ සාමාජිකයින් සතු විය යුතුය. යම් සමාජයක මිනිසුන්ගේ මෙවැනි හැසිරීම් රටාව ක්‍රියාත්මක වන්නේ කෙසේ ද, ඒවා පාලනය වන්නේ කෙසේ ද, ඒ සඳහා බලපානු ලබන ආචාර ධර්ම, සාර ධර්ම ඇගයුම් ප්‍රතිමාණ ගැන අවබෝධයක් අපට ලබා ගත හැකි වන්නේ සමාජ විද්‍යා පදනම් කරගෙනය.

සිංහල සමාජ සංස්කෘතියෙහි පැවැති සම්මත වූ ආචාර ධර්ම මිනිසාගේ සමාජ ජීවිතයේ දී බලපානු ලබන්නේ කෙසේද යන්න අපට හඳුනා ගත හැක්කේ සමාජ විද්‍යාත්මකව ඒ ගැන කරුණු සෙවීමෙනි. ආචාර ධර්ම සාර ධර්ම රැඳි සමාජයක් ලෙස ශ්‍රී ලාංකික සමාජයටත් සිංහල සංස්කෘතියටත් හිමිවන ස්ථානය අපට අවබෝධය කරගත හැක්කේ ඔවුන්ගේ චර්යා රටාව තුළිනි. දිගු ඉතිහාසයක් ඇති ශ්‍රී ලංකාවේ බෙහෙවින් සදාචාරවත් සමාජයක් තිබූ බව ඉතිහාස පොත පත සාක්ෂි දරයි. වර්තමානය වන විට එවැනි සංකල්පයන්ට අපේ සමාජයේ හිමිවන්නේ කුමන වැදගත් කමක් ද, ඒවා සිංහලයන්ගේ චර්යා කෙරෙහි කුමන ආකාරයෙන් බලපානු ලබන්නේ ද යන්න වර්තමාන සමාජය තුළින් හඳුනාගත හැකිය. අචාර ධර්ම ලෙස අප හඳුනා ගන්නේ සමාජයේ දිගු කාලයක් පැවැති මිනිසාගේ සාමාජික ජීවිතයට වැදගත් වන්නා වූ රීති සමුදයකි. බොහෝ විට සමාජයේ නොයෙකුත් ව්‍යසනයන්හි දී එනම්, මිනී මැරුම්, දූෂණ, අපරාධ, වංචා කිරීම් ආදියන්හි දී සමාජයත්, සමාජ ආචාර ධර්ම පිරිහී ඇති ආකාරයත්, කතා බහ කරති. එහෙත් මෙම සමාජ ආචාර ධර්ම සමාජය හා සම්බන්ධ වන්නේ කෙසේ ද ඒවා පිරිහී යන්නේ මන්ද, සමාජ සංවර්ධනයට මෙවැනි සංකල්ප හිතකර ද? අහිතකර ද? යන වග මෙතෙක් ප්‍රමාණවත් සැලකිල්ලට බඳුන් වී නොමැති බව හැඟී ගිය බැවින් සමාජ විද්‍යාත්මක පර්යේෂණයක් මගින් ප්‍රදේශ කිහිපයක ජනතාව සමඟ සම්මුඛ සාකච්ඡා මගින් ද මෙම සංකල්ප පිළිබඳ විවිධ මූලාශ්‍ර ද උපයෝගී කොට ගෙන සමාජ සම්මත ආචාර ධර්ම සමාජයේ පැවැත්ම උදෙසා බලපානු ලබන්නේ කෙසේ ද යන්න අධ්‍යයනය කිරීම මගේ අරමුණ විය.

සමාජ සංවර්ධනය සඳහා අභෞතික සංස්කෘතික සංවර්ධනය කෙරෙහි අවධානය යොමු වන මෙවැනි අවධියක සාර ධර්ම, ආචාර ධර්ම වැනි සංකල්ප මිනිසුන්ගේ අධ්‍යාත්මය සකස් කරන ආකාරයත් එම ක්‍රියාවලිය සමාජයට බලපානු ලබන ආකාරයත් මෙවැනි කෘතියක් තුළින් විමසා බැලීම වැඩදයක වනු ඇතැයි අපේක්ෂා කරමි.